# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/AB/06/06/KKS/EB (II වෙළුම)

තැ.පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.


දිනය / திகதி / Date 2026.07.17

කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
ලේඛනාගාර භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්,

**<u>කාර්යාල සේවක සේවයේ I, II, සහ III ශ්‍රේණිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2026</u>**

අංක 1777/35 හා 2012.09.27 දිනැති කාර්යාල සේවක සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව 2026 වර්ෂයට අදාළව කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී.

02. එබැවින් මේ පිළිබඳව ඔබ කාර්යාලයේ සේවයෙහි නියුතු කාර්යාල සේවක සේවයේ සියලුම නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. තවද, මේ වනතෙක් තම ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී නොමැති, I, II සහ III ශ්‍රේණිවල කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා තම ශ්‍රේණියට අදාළ නියමිත අයදුම්පත්‍රය වෙබ් අඩවියෙහි ඇතුළත් කර ඇති අතර එමඟින් භාගත කර ගත හැක. එය නිලධාරීන් විසින් සම්පූර්ණ කර භාර දුන් පසු ඔබගේ නිර්දේශය ද සහිතව 2026.08.31 දිනට පෙර admin@rgd.gov.lk යන ඊ තැපැල් ලිපිනය වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වන අතර, දෘඪ පිටපත තැපැල මඟින් හෝ අතින් ප්‍රධාන කාර්යාලය වෙත භාරදීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

04. එමෙන්ම, 2026.08.31 දින වනවිට උසස් වීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කර ඇති නමුත්, එයට අදාළ උසස්වීම් ලිපි මෙතෙක් නොලද නිලධාරීන් තමන් උසස්වීමට නියමිත ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඒ බව අයදුම්පත්‍රයෙහි සඳහන් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එච්.පී. චන්ද්‍රලාල්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්(පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට


දුරකථන අංකය - 0112072038
ෆැක්ස් අංකය - 0112889493
විද්‍යුත් ලිපිනය - admin@rgd.gov.lk


පිටපත :

ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන් - තම අංශයෙහි කාර්යාල සේවක සේවයේ නිලධාරීන් දැනුවත් කිරීමට හා අ.ක.ස.